**කොවිඩ් 19 - සති පාසල**

**2021 - තුන්වන වාරය - තුන්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 5 පාඩම - නිෂ්පාදන කර්මාන්ත

**නැව් තැනීමේ කර්මාන්තය (පෙළ පොත පිටු අංක 99-102)**

- 18 වන සියවස අගභාගයේදී දේශගවේෂණ කටයුතු, යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තයේ දියුණුව යනාදියත් සමඟ යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය වර්ධනය විය.
- වර්තමාන ලෝකයේ ප්‍රවාහනයට යොමුවන භාණ්ඩ වර්ග අනුව සුවිශේෂී නැව් නිෂ්පාදනයට යොමු වී ඇත. උදා:- ටැංකි නෞකා, බහාලුම් නෞකා, තොග භාණ්ඩ ප්‍රවාහන නෞකා, මගී ප්‍රවාහන නෞකා
- මුල් කාලයේදී නැව් නිෂ්පාදනය කෙරෙහි සංවර්ධිත රටවල් යොමු වුවද, වර්තමානය වන විට චීනය, දකුණු කොරියාව, ජපානය වැනි ආසියාතික රටවල්ද නැව් නිෂ්පාදනයට යොමු වීම විශේෂත්වයකි.
- මෑතක සිට එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේද නැව් හා බෝට්ටු නිෂ්පාදනය ආරම්භ වී ඇත.

**ක්‍රියාකාරකම**

01. නැව් තැනීමේ කර්මාන්තයෙහි ඉතිහාසය කෙටියෙන් හඳුන්වන්න.

02. මුල් කාලයේ නැව් තැනීමේ කර්මාන්තය සඳහා සංවර්ධිත රටවල් පමණක් යොමුවීමට හේතු තුනක් ලියන්න.

03. අවශ්‍යතාව අනුව/ ප්‍රවාහනයට යොමුවන භාණ්ඩ වර්ග අනුව ලෝකයේ විවිධ වර්ගයේ නැව් නිෂ්පාදනය කරයි. එවැනි නැව් වර්ග හතරක් ලියන්න.

04. වර්තමානය වනවිට නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත්ව ඇති ආසියාතික රටවල් තුනක් නම් කරන්න.

05. නැව් තැනීමේ කර්මාන්තයෙහි දක්නට ඇති ප්‍රවණතා පහක් ලියා දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.